**හිතවත් ගනුදෙනුකරුවනි,**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු සැලසුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබදව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් KFD හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් KFD හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබදව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.

ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් ආකාරයට www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 011 4 711 411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර **පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 2** යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [**+94(0)114711411**] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබඳ විස්තර | ගනුදෙනුකරුව න්ට ලැබෙන ප්‍රතිලාභ | ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු | ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **විදේශ මුදල් ආයෝජන සැලැස්ම** | | | | |
| මෙය විදේශ මුදලින් උපයන ගනුදෙනුකරුවන්ට මධ්‍ය කාලීන ආයෝජනය සඳහා ඉහළ පොලී අනුපාතයකට තම ආදායමෙන් කොටසක් ආයෝජනය කිරීම සඳහා නිර්මාණය කර ඇති සැලසුමකි. | • ආයෝජන කාලසීමාව තුළ 4.25%ක සහතික වූ පොලී අනුපාතය<br><br>• වසර 3ක සහ 5ක ආයෝජන කාලසීමාව | • බැංකුවේ සම්මත ගාස්තු සහ අයකිරීම් යෙදවේ | • නිසි පරිදි සම්පූර්ණ කරන ලද නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලැසුම් ගිණුම විවෘත කිරීමේ පෝරමය, ජාතික හැඳුනුම්පතේ (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්.<br><br>• ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනය හා පදිංචි ලිපිනය වෙනස් නම් ලිපින තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ. | සුදුසුකම් ලැබීමේ නිර්ණායක:<br><br>• විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන්<br>• ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් (ස්ථිර පදිංචිකරුවන්)<br>• අමෙරිකානු ඩොලර්වලින් උපයන ශ්‍රී ලාංකික පදිංචිකරුවන්<br>• ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටි/සිටින, ශ්‍රී ලාංකික ජාතිකයන් නොවන, ශ්‍රී ලාංකික සම්භවයක් ඇති (ශ්‍රී ලංකාවේ උපන්) අය.<br>• ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියන්<br>• අනේවාසිකයින්ට වෘත්තීය සේවා සැපයීමෙන් විදේශ මුදලින් උපයන ශ්‍රී ලාංකිකයන්<br><br>• අවම ශේෂයක් පිළිබද අවශ්‍යතාවයක් නොමැත. කෙසේ වෙතත්, ගනුදෙනුකරුට සම්පූර්ණ ඉලක්කගත මුදල ලගා කර ගැනීමට හැකි වන පරිදි ස්ථාවර මාසික වාරිකය අඛණ්ඩව ප්‍රේෂණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | • බැංකුව විසින් ලබා දී ඇති කලින් තීරණය කළ ආයෝජන සැලැස්මේ ගෙවීම් කාලසටහනෙන් ගනුදෙනුකරුට සිය අභිමතය පරිදි තීරණය කළ හැක්කේ ඉලක්කගත අගය මිස මාසික වාරිකය නොවේ<br><br>ඉලක්කගත අගය රජයේ බදුවලට යටත් වේ (අදාළ වේ නම්).<br><br>• නේෂන්ස් කිඩ්ස් ආයෝජන සැලැස්ම යටතේ සහ පුද්ගලික ආයෝජන සැලසුම් ගිණුම යටතේ ගනුදෙනුකරුට රක්ෂණ ආවරණයක් ලබාදී ඇත්නම්, ගනුදෙනුකරුගේ මරණයේදී ලැබිය හැකි උපරිම රක්ෂිත මුදල වන්නේ රුපියල් 2,000,000 කි. |

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි නේෂන්ස් විදේශ මුදල් ආයෝජන සැලැස්මට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසිය යටතේ https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf හි දක්වා ඇත.

- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් බලපැවැත්විය යුත්තේ මෙහි ඉංග්‍රීසි පිටපතයි.